# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2420/14 - 2025 ජනවාරි මස 21 වැනි අඟහරුවාදා - 2025.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2020/114.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.04.25. දිනැති හා අංක 2381/30 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.04.17 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මොනරාගල, කුඹුක්කන, ජයසෙන්ගම, අංක 67 හි පදිංචි කේ. එම්. එන්. කරුණාතිලක මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, නාරාහේන්පිට, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක ඒ 22/2024 හා 2024.11.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
**කම්කරු කොමසාරිස් ජනරාල්.**

2024 දෙසැම්බර් මස 31 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A - G 043523 - 09 (2025/01)


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov. lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක*

කොළඹ - බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව

කේ. එම්. එන්. කරුණාතිලක මයා,
අංක 67, ජයසෙන්ගම,
කුඹුක්කන, මොනරාගල.

නඩු අංකය: A/22/2024
IR/COM/02/2020/114

*පළමු පාර්ශ්වය*

සහ

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර, නාරාහේන්පිට,
කොළඹ 10

*දෙවන පාර්ශ්වය*

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර අමාත්‍යවරයා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2024.04.17 වන දින බේරුම්කරු වශයෙන් පියල් දර්ශන ගුරුගේ වන මා පත් කර ඇත.

මෙම කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු කම්කරු කොමසාරිස් ජනරාල්වරයා විසින් පහත සඳහන් පරිදි ප්‍රකාශයට පත් කර ඇත.

"ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ සේවක කේ. එම්. එන්. කරුණාතිලක මහතාට විරුද්ධව පැවති විනය පරීක්ෂණයේදී ශ්‍රී ලංගම/මාසක/විනය/111/2020 හා 2020.01.17 දිනැති විනය නියෝගය පරිදි සියලු චෝදනාවන්ට නිවැරදිකරු වී තිබියදී පහත සඳහන් කරුණු මගින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේද, යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේනම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.

01. කේ. එම්. එන්. කරුණාතිලක මහතාට සී/ස ඌව බස් සමාගමේ සේවක මණ්ඩල කළමනාකරුගේ අංක සීස/ඌබස/සේමකො/04-03/2004 හා 2004.11.10 දිනැති ලිපිය මගින් ලබා දී ඇති ii ශ්‍රේණියේ ඩිපෝ කළමනාකාර තනතුර ශ්‍රීලංගම/බඳු/ප්‍රාකා/මුදල්/2017/05 හා 2017.12.01 දිනැති ලිපිය මගින් එම තනතුර වංචනිකව ලබා ගත් එකක් බව පවසා ii ශ්‍රේණියේ ඩිපෝ කළමනාකරු තනතුරට ගෙවන ලද වැටුප ආපසු අය කර ගැනීම.

02. ii ශ්‍රේණියේ ඩිපෝ කළමනාකරු තනතුරේ වැටුප නොලබා එම තනතුරේ රාජකාරි කිරීමට සැලැස්වීම.

03. 2004 වර්ෂයේ සිට විශ්‍රාම ගිය දිනය තෙක් වැටුප් වර්ධක හා අනෙකුත් දීමනා හිමි ද, හිමි නම් ඒවා ලබා නොදීම."

මෙකී ආරාවුල සම්බන්ධයෙන් සාක්ෂි විභාගය අතරතුර වගඋත්තරකාර ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව සමථ යෝජනාවක් බේරුම්කරණයට ඉදිරිපත් කරන ලද අතර එකී සමථ යෝජනාව පැමිණිලිකාර පළමු පාර්ශ්වය විසින් කොන්දේසි විරහිතව පිළිගන්නා ලදී. එකී සමථ යෝජනාව පහත පරිදි වේ.

නඩුවේ ඉල්ලුම්කරුට පූර්ණ හා අවසාන සමථයක් ලෙස,

(i) හිඟ වැටුප රු. 724,230/-ක මුදලක්ද,

(ii) හිඟ පාරිතෝෂිත මුදල වන රු. 239,375/-ක මුදලක්ද,

(iii) හිඟ අර්ථ සාධක හා භාරකාර මුදල ලෙස රු. 108,634/- ක මුදලක් ගෙවීම.

ඒ අනුව ගෙවිය යුතු සම්පූර්ණ මුදල ලෙස රු. 1,072,239/-ක මුදලක් 2024.12.25 දින හෝ එදිනට පෙර ගෙවා අවසන් කිරීම යන එකඟතාව මත දෙපාර්ශ්වය විසින්ම සමථයට එකඟ වන ලදී. ගෙවීමෙන් පසු චෙක්පතෙහි ඡායා පිටපතක් බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව වෙත ඉදිරිපත් කිරීමට නියම කරමි.

ඒ අනුව දෙපාර්ශ්වය විසින් ඇති කර ගත් ඉහත සමථ කොන්දේසිවලට යටත්ව මෙම පරීක්ෂණයේ කටයුතු අවසන් කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි.

නීතිඥ පියල් දර්ශන ගුරුගේ,
බේරුම්කරු.

2024 නොවැම්බර් මස 28 වන දින.

EOG 01 - 0188